# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2252/56 - 2021 නොවැම්බර් මස 06 වැනි සෙනසුරාදා - 2021.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාණන් විසිනි

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

ජනාධිපති විධානය

1. පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර ස්වාමින් වහන්සේ
2. මහාචාර්ය ශාන්ති නන්දන විජේසිංහ මැතිතුමා
3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වීරවර්ධනලාගේ සුමේධ මංජුල මැතිතුමා
4. එන්.ජී. සුජීව පණ්ඩිතරත්න මැතිතුමා
5. නීතිඥ ඉරේෂ් සෙනෙවිරත්න මැතිතුමා
6. නීතිඥ ඩබ්ලිව්.පී.ජේ.එම්.ආර්. සංජය බණ්ඩාර මාරඹේ මැතිතුමා
7. ආර්.ඒ. එරන්ද කුමාර නවරත්න මැතිතුමා
8. පානි වැවල මැතිතුමා
9. මවුලවි එම්.ඉසෙඩ්.ඒ.එස්. මොහොමඩ් (බාරි) මැතිතුමා
   සභාපති, ගාල්ල උලමා සභාව
10. කලීල් රහුමාන් මැතිතුමා
11. අබ්දුල් අසීස් මොහොමඩ් නිසාර්දීන් මැතිතුමා

වෙත,

ශුභා ශිංසන පූර්වකවය !

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2021.10.26 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද එක රටක්, එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,


1A - G 35291 — 370 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම බලකායේ සාමාජික සංයුතිය සහ විෂය නිර්ණය සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන්ගෙන් ලැබී ඇති නියෝජනයන් සැලකිල්ලට ගනිමින් ද,

තවද, මෙම කාර්ය සාධක බලකාය වෙත පැවරී ඇති විෂය නිර්ණය අනුව, ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කාර්ය සාධක බලකා සාමාජික සංයුතිය තුළ පිළිඹිබු වීමේ අවශ්‍යතාවය අවධානයට ලක්කරමින් ද,

තවද, මෙම කාර්ය සාධක බලකායේ සාමාජික මහාචාර්ය දයානන්ද බණ්ඩා මැතිතුමා සහ කථිකාචාර්ය මොහොමඩ් ඉන්තිකාබ් මැතිතුමා උක්ත කාර්ය සාධක බලකායේ සාමාජික ධුරයෙන් ඉවත් වී ඇති බැවින්ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් නිලධාරීන්, එතුමන්ලාගේ විෂය පිළිබඳ වූ ප්‍රායෝගික දැනුම හා ක්ෂේත්‍රය තුළ අත්දැකීම් බහුලත්වය සහ විශ්වාසවන්තභාවය සැලකිල්ලට ගනිමින් පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටවනු ලැබූ එක රටක්, එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයන් ලෙස මෙයින් පත් කරමි.

1. රාමලිංගම් චක්‍රවර්ති කරුණාකරන් මැතිතුමා
2. යෝගේෂ්වරී පත්ගුණරාජා මැතිතුමිය
3. අයියාම්පිල්ලෙයි දයානන්දරාජා මැතිතුමා

තවද, උක්ත කාර්ය සාධක බලකායට පවරා ඇති කාර්යයන් පහත පරිදි සංශෝධනය කරමි.

1. ශ්‍රී ලංකාව තුළ "එක රටක් එක නීතියක්" යන සංකල්පය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් දරන අදහස් හා මතවාදයන් ද සැලකිල්ලට ගනිමින් එකී සංකල්පය අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඒ සඳහා ශ්‍රී ලංකාවට ආවේනික වූ සංකල්පමය රාමුවක් සකස් කිරීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිඑකක් වූ නොවැම්බර් මස 06 වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.